# අන්තර් පුද්ගල බුද්ධිය

අන්තර් පුද්ගල බුද්ධිය (People Smart) යනු අනෙක් පුද්ගලයන් තෙරුම් ගැනීමයි.

අන් අයගේ මනෝභාවයන්, අභිප්‍රේරණ සහ ආශාවන් හඳුනා ගෙන ඒවාට නිසි ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාවයි.

ඉහළ අන්තර් පුද්ගල බුද්ධියක් ඇති පුද්ගලයන් අන් අයගේ මනෝභාවයන්, හැගීම්, ස්වභාවයන් සහ අභිප්‍රේරණවලට සංවේදී වෙයි.

**අන්තර්පුද්ගල බුද්ධිය සහිත පුද්ගලයන් හොඳින් ඉගෙන ගන්නේ,**

- ගුරුවරයාට හෝ මිතුරන්ට ප්‍රතිපෝෂණ ලබා දීමෙන්
- අන් අයගේ හැගීම් තේරුම් ගැනීමෙන්
- පුද්ගල සන්නිවේදනයෙන්
- සමූහ ඉගෙනුම් උපාය මාර්ග මගින්
- ප්‍රතිපෝෂණ ලැබීමෙන්
- කණ්ඩායම් ව්‍යාපෘති මගින්
- යම් කෙනෙකුට අලුත් දෙයක් ඉගැන්වීම මගින්
- නව දෘෂ්ටි කෝණ මගින් බැලීමෙන්
- කණ්ඩායම් අතර අනුගමනය කළ යුතු නීති රීති නිර්මාණය කිරීමෙන්
- නාට්‍යක හෝ අනුකරණයක රගපෑම මගින්
- සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින්
- ගෙදර වැඩ සඳහා දුරකතන මිතුරුන් ඇති කර ගැනීම මගින්
- අන් අයගේ හැගීම්, දැනීම් තේරුම් ගැනීම මගින් ආදී...

**රැකියා/ වෘත්ති**

- පරිපාලක
- මානව විද්‍යාඥ
- උපදේශක
- කළමනාකරු
- හෙදි
- පිරිස් අධ්‍යක්ෂ
- දේශපාලඥ
- සමාජ සේවක
- මානව සම්බන්ධතා නිලධාරී
- විකුණුම්කරු
- විදුහල්පති
- සමාජ විද්‍යාඥ
- චිකිත්සක
- ගුරු
- සංචාරක නියෝජිත
- ආගමික නායක
- මනෝවිද්‍යාඥ ආදී...

Guidance and Counseling Unit, National Institute of Education, Maharagama